Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## 6 ඒකකය - සත්ත්ව විවිධත්වය(2)

✓ පෙළ පොත හෝ වෙනත් සුදුසු ඉගෙනුම් සම්පත් පරිශීලනයෙන් පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න. අවශ්‍ය තැන්හි දී වැඩිහිටියෙකුගේ සහය ලබා ගන්න




6.7 රූපය ▲ පරිසරයට ගැළපී සිටින සතුන් කිහිපදෙනෙක්

### පැවරුම 6.3

ඉහත දක්වූ 6.7 රූපය ඇසුරින් පහත දක්වා ඇති වගුව සම්පූර්ණ කරන්න.

| සත්ත්වයාගේ නම | පරිසරය | පරිසරයේ වර්ණය | ශරීර වර්ණය |
|---|---|---|---|
| තණකොළ පෙත්තා | ශාක පත්‍ර | ..................... | ..................... |
| ජේර කොළයා | ජේර ශාක පත්‍ර | ..................... | ..................... |
| සමනලයා | පුෂ්ප | ..................... | ..................... |
| දළඹුවා | ශාක පත්‍ර | ..................... | ..................... |
| ඇහැටුල්ලා | ශාක අතු | ..................... | ..................... |
| සලබයා | ශාක කඳ | ..................... | ..................... |

### පැවරුම 6.4

වේශාන්තරය පෙන්වන සතුන් සඳහා හැකි තරම් පමණ හඳුනා ගන්න. ඔවුන්ගේ පින්තූර එකතුවක් සකස් කරන්න.

## ක්‍රියාකාරකම 6.3

**සංචරණය සඳහා ශරීරයේ හැඩය වැදගත් වන ආකාරය සොයා බැලීම**

**අවශ්‍ය ද්‍රව්‍ය** :- බණ්ඩක්කා කරල් කිහිපයක්, 50cm පමණ දිග නූල් කැබලි දෙකක්, කුඩා ක්ලේ ගුලි දෙකක්, අල්පෙනිති

**ක්‍රමය :** රූපයේ දැක්වෙන ආකාරයට බණ්ඩක්කා කරල් කපා සකසා ගන්න.




කපා සකස් කර ගත් බණ්ඩක්කා කරල්වලට පහත දැක්වෙන ආකාරයට කුඩා බරක් සම්බන්ධ කරගන්න.




රූපයේ දැක්වෙන ආකාරයට සකස් කර ගත් දිගින් සමාන බණ්ඩක්කා ව්‍යූහ දෙක එකම තැටියක ජලයේ ගමන් කිරීමට සලස්වන්න.




මෙම ව්‍යූහ දෙකම ජලයේ එකම වේගයෙන් ගමන් කරන්නේ ද නැතහොත් එක් එක් ව්‍යූහයේ වේග වෙනස්දැයි නිරීක්ෂණය කරන්න.